කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

---

2020 මැයි මස 14 දින සඳහා කාලගුණ අනාවැකිය

2020 මැයි මස 13 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

දිවයින ආශ්‍රිත පහළ වායුගෝලයේ පවතින කැළඹිලි තත්ත්වයක් හේතුවෙන් ඉදිරි දින කිහිපයේදී දිවයිනේ බොහෝ ප්‍රදේශවල වැසි තත්ත්වයේ තරමක වැඩිවීමක් බලාපොරොත්තුවේ.

දකුණු පළාතේ සහ කළුතර දිස්ත්‍රික්කයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

මධ්‍යම, සබරගමුව ඌව, නැගෙනහිර සහ උතුරු මැද පළාත් වලත්, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලත් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දකුණ, මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත් වලත් කළුතර සහ අම්පාර දිස්ත්‍රික්ක වලත් ඇතැම් ස්ථාන වලට මි.මී.100 ක පමණ තද වර්ෂාපතනයන් ද ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට අකුණු මඟින් සහ තාවකාලික තද සුළං මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR 14 MAY 2020

**Issued at 12.00 noon on 13 May 2020**

**The showery condition over the island is likely to enhance to some extent, due to the low level atmospheric disturbance in the vicinity of Sri Lanka during next few days.**

Showers or thundershowers will occur in Southern province and in Kaluthara district.

Showers or thundershowers will occur in Central, Sabaragamuwa, Uva, Eastern and North-central provinces and in Colombo and Gampaha districts in the evening or night.

Heavy falls about **100 mm** can be expected at some places in Southern, Central, Sabaragamuwa and Uva provinces and in Kaluthara and Ampara districts.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity and localized strong winds during thundershowers.**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2020/05/13
12:43 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකි

**2020 මැයි මස 13 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.
ගාල්ල සිට හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථානවල තද වැසිද ඇතිවිය හැක.

**සුළඟ:**

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළං ගිනිකොණ දෙසින් හමයි. සුළගේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ. ගාල්ල සිට මාතර හරහා හම්බන්තොට දක්වා වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (40-50) දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැකි අතර ගාල්ල සිට මාතර හරහා හම්බන්තොට දක්වා වන ගැඹුරු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළුවේ.
ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.
ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 12.00 noon on 13 May 2020**

**Condition of Rain:**

Showers or thundershowers will occur at several places in the sea areas around the island. Heavy showers can be expected at some places in the sea areas extending from Galle to Batticaloa via Hambanthota.

**Winds:**

Winds will be South-westerly in the sea area extending from Puttalam to Potuvil via Colombo, Galle and Hambantota and winds will be South-easterly in the other sea areas around the island. Wind speed will be (20-30) kmph. Wind speed can be increase up to (40-50) kmph at times in the deep sea area extending from Galle to Hambantota via Matara.

**State of Sea:**

The sea areas around the island can be moderately rough and the deep sea area extending from Galle to Hambantota via Matara will be fairly rough at times.
**Temporarily strong gusty winds (up to 70-80 kmph) and rough seas can be expected during thundershowers.**
**Navel and fishing communities are requested to be vigilant in this regards.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි